# 10 ධනය උපයමු දැහැමි විලසින්

එදා ධර්මප්‍රදීප මහා විද්‍යාලය ශාන්ත සුන්දර බවක් ඉසුලුවේ ය. පාසල් භූමිය බෞද්ධ කොඩිවලින් සරසා තිබිණි. දරු දැරියන් මෙන් ම ගුරුවරු ද සුදෝ සුදුවතින් සැරසී සිටියෝ ය. දෙමාපියන් ද මෙ දින පැමිණ සිටියේ අතිශය සන්තෝෂයෙනි. මෙ වැනි විශේෂත්වයක් ඉසිලීමට හේතුව වූයේ වෙසක් සතිය යි. විද්‍යාලයීය බෞද්ධ සංගමය මෙ දින සංවිධානය කර තිබුණේ ධර්ම සාකච්ඡාවකි. මෙම ධර්ම සාකච්ඡාව සඳහා එදින ආරාධනා ලැබ සිටියේ ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේත් ධර්මප්‍රදීප මහා විද්‍යාලයයේ විදුහල්පතිතුමාත්, එම විද්‍යාලයයේ ම බුද්ධ ධර්මය උගන්වන ගුණවර්ධන ගුරුතුමාත්, විහාරස්ථ කුලඟන සමිතියේ සභාපති කුසලා ධර්මරත්න මහත්මියත් ය. මෙම සාකච්ඡාව මෙහෙයවනු ලැබුවේ බෞද්ධ සංගමයේ සභාපති උදර සඳකැලුම් ශිෂ්‍යයා විසිනි.

උදර සැමදෙනාට ම තෙරුවන් සරණයි. සම්බුදු තෙමඟුල සිහිපත් කරන මේ උතුම් වෙසක් සතියේ අප පාසලේ සිදු කරනු ලබන ආගමික කටයුතු අතර අදට නියමිත ව තිබෙන්නේ ධර්ම දානමය පිංකමක් වන ධර්ම සාකච්ඡාව පැවැත්වීම යි. මේ සඳහා අපගේ ආරාධනාව පිළිගෙන මෙම ස්ථානයට වැඩමවා වදාළ අපේ පන්සලේ ගෞරවනීය ලොකු හාමුදුරුවන් වහන්සේ මම ප්‍රථමයෙන් ම දෙපා නැමද පිළිගන්නවා. ඒ සමඟ ම අපේ පාසලේ ගරු විදුහල්පතිතුමා ද, අපට බුද්ධ ධර්මය උගන්වන ගරු ගුණවර්ධන ගුරුපියාණන් ද, අපේ පන්සලේ කුලඟන සමිතියේ ගරු සභාපතිතුමිය වන කුසලා ධර්මරත්න මහත්මිය ද ගෞරවාදරයෙන් පිළිගන්නවා. අද දින අපේ දම්සභා මණ්ඩපයේ සාකච්ඡාව සඳහා තෝරාගත්තේ "ධනය ඉපයීම" යන කාලීන මාතෘකාව යි. ජීවත් වීම සඳහා ධනයේ අවශ්‍යතාව සැමදා ම තිබෙනවා. ධනය නැති වූ විට දිළිඳුකම ඇති වී මිනිසා සොරකම් කිරීම, බොරු කීම, අවිආයුධ පරිහරණය, මනුෂ්‍ය ඝාතනය ආදී විසම ක්‍රියාවන්ට යොමුවන බව බුදුදහම පෙන්වා තිබෙනවා. සමහරු පහසුවෙන් ධනය ඉපයීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළා. ඇතැමෙක් සාධාරණ යැ යි සම්මත ක්‍රියාවන්ගෙන් ධනය උත්පාදනය කර ගැනීමට පෙළඹුණා. ඒ අනුව ධනය පුද්ගල ජීවිතය හා බද්ධ වුණු අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වී තිබෙනවා. අතීතයේ පමණක් නොව වර්තමානයේ ද මිනිසා ධනය උත්පාදනය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන බව අපට පෙනෙනවා. ඒ සඳහා අනුගමනය කරන ක්‍රමෝපායයන් මොනවාද යි අපි ප්‍රථමයෙන් විමසීමට ලක් කරමු. මේ පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීමට මාගේ පළමු ආරාධනාව අපේ පන්සලේ කුලඟන සමිතියේ ගරු සභාපතිතුමියට යි.

**කුසලා ධර්මරත්න:** සියලුදෙනාට ම තෙරුවන් සරණ ලැබේවා යි ප්‍රාර්ථනා කරනවා. මුලින් ම ධනය යනු කුමක් දැයි අපි හඳුනා ගනිමු. පුද්ගලයා දිවි පවත්වා ගැනීම සඳහා යොදා ගන්නා භෞතික සම්පත් සියල්ල ධනය වශයෙන් හඳුන්වන්න පුළුවන්. එය මිල මුදල්, වතු පිටි, හරකා බාන, ගේ දෙර, යාන වාහන ආදි වශයෙන් වර්ග කළ හැකි යි. මේවා වර්තමානයේ මිනිස් ජීවිතයේ ප්‍රබල අවශ්‍යතා ලෙස සැලකෙන බව අප දන්නවා. ඉතින් මේ සම්පත් ඉපයීම සඳහා අද මිනිසා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරනවා. ඒවා පොදුවේ ගත් කල සාධාරණ හා අසාධාරණ වශයෙන් ද ධාර්මික හා අධාර්මික වශයෙන් ද හඳුන්වන්න පුළුවන්. කෙනෙක් සොරකම් කිරීමෙන් ද මං පැහැරීමෙන් ද මනුෂ්‍ය ඝාතනය කිරීමෙන් ද වංචනික වෙළඳාම් මගින් ද විවිධ අපචාර ක්‍රියා තුළින් ද සම්පත් උපයා ගැනීමට පෙළඹෙනවා.

ඒ විතරක් නෙවෙයි පොදු දේපළ අයථා ලෙස පරිහරණය කිරීම, නිදන් හැරීම වැනි ජාතික අපරාධ තුළින් ද සමහරු ධනය රැස් කරනවා. ඇතැමුන් සූදු ක්‍රීඩාවෙන් ද පොළියට මුදල් දීමෙන් ද, ධනය රැස් කිරීමට පෙළඹී සිටින බව අපට පෙනෙන කරුණක්. ඒත් මේ සියල්ල අසාධාරණ අධාර්මික ක්‍රියාවන් ලෙස යි අප දකින්නේ. ඇතැම් අය ගොවිතැන් කිරීමෙන් ද වෙළඳාම් කිරීමෙන් ද, රාජ්‍ය සේවය කිරීමෙන් ද, විවිධ ශිල්ප කර්මාන්ත මගින් ද ධනෝත්පාදනය කරන බව අප දකිනවා. එ වැනි ක්‍රම සාධාරණ නැතහොත් ධාර්මික ක්‍රියා වශයෙන් හඳුන්වන්න පුළුවන්.

උදුර : හොඳයි සභාපතිතුමියනි, ඔබ මුලින් ම පැහැදිලි කර දුන්නේ වර්තමානයේ මිනිසා ධනය ඉපයීම සඳහා අනුගමනය කරනු ලබන වැරදි ක්‍රියා මාර්ග. එම ක්‍රියා තව දුරටත් විස්තර වුනොත් හොඳ යි කියල යි මා හිතන්නේ. ඒ අනුව මා දැන් ආරාධනා කරන්නේ ඒ පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන්නට අපේ විද්‍යාලයයේ ගරු විදුහල්පති තුමාට.

**විදුහල්පතිතුමා:** හොඳයි පුතා, අපේ පාසලේ වෙසක් සතිය නිමිත්තෙන් බෞද්ධ සංගමය තෝරා ගෙන ඇත්තේ ඉතාමත් කාලෝචිත තේමාවක්. මිනිසාට ප්‍රබල බලපෑමක් ඇති කරන දෙයක් තමයි ධනය. ඉතින් අපේ ධර්මරත්න මහත්මිය පෙන්වා දුන්නා වර්තමානයේ ධනය උපයන්නට මිනිසුන් අනුගමනය කරන ක්‍රියාමාර්ග කිහිපයක්. ඒවායින් එකක් තම යි සොරකම් කිරීම. මෙය විවිධාකාරයෙන් සිදු වෙනවා. ඒ අතර කාලය සොරකම් කිරීම එකක්. අදාළ කාලසීමාව තුළ තම ශ්‍රමය නිසි පරිදි යොදවන්නේ නැති නම් එය කාලය සොරකම් කිරීමක්. අනුන් සතු ධන ධාන්‍ය සොරකම් කිරීම තවත් දෙයක්. කම්කරුවා වැය කරන ශ්‍රමයට සරිලන වැටුපක් නොදීම ශ්‍රමය සොරකම් කිරීම යි. මේ අතර සමහරුන් මුදල් ලබාගෙන මිනිසුන් මරන අතර බැංකු මංකොල්ලකෑම, අල්ලස් ලබා ගැනීම, ව්‍යාපාරික ආයතන මංකොල්ල කෑම, වැනි විවිධ දේ තුළින් ධනය රැස් කරනවා. මේ අතරට ගණිකා නිවාස පවත්වා ගෙන යාම, කුඩා ළමුන් විවිධ අපචාර සඳහා යොදවා මුදල් ලබා ගැනීම, දරුවන් විකිණීම, විවිධ ව්‍යාජ නම්වලින් ආයතන පවත්වා ගෙන යාම, වැනි සංවිධානාත්මක ක්‍රම අනුගමනය කිරීම ද අද සමාජයේ කොතෙකුත් අපට දක්නට ලැබෙනවා. ඒ විතරක් නෙවෙයි කාර්යාලයීය උපකරණ හා රජය සතු විවිධ දේපළ අනිසිලෙස පරිහරණය කිරීම ද අද බහුලව සිදුවෙනවා. මේ සියල්ල අප දකින්නේ මිනිසා ධනය රැස් කිරීම සඳහා අනුගමනය කරන නොදැහැමි සදචාර විරෝධී ක්‍රියා හැටියට යි.

උදුර: අපේ විදුහල්පතිතුමා ඒ පැහැදිලි කර දුන්නේ අද මිනිසුන් ධනය උපයා ගැනීමට අනුගමනය කරන වැරදි ක්‍රියා මාර්ගවලින් කිහිපයක්. මීට පෙර සභාපති තුමිය පෙන්වාදුන්නා අද සමහර කෙනෙක් සාධාරණ ධාර්මික ක්‍රියා අනුගමනය කරමින් ධනය උපයා ගැනීමට උත්සාහ කරන බව. මා කැමති යි අපේ පාසලේ බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුතුමාගෙන් ඒ දැහැමි මාර්ගය තව දුරටත් විස්තරාත්මක ව දැනගන්නට.

ගුණවර්ධන ගුරුතුමා : ඇත්තෙන් ම වර්තමානය වන විට සමහර කෙනෙක් අනුන්ගේ වස්තුවට ඊර්ෂ්‍යා නො කොට තම ශක්තිය වැය කොට දහඩිය වගුරුවා ගොවිතැන් කරමින් නිදි වරා ගෙන සතුන් සිවුපාවුන් ගෙන් ආරක්ෂා කර ගනිමින් තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට උත්සාහ දරනවා. ඒ සමඟ ම සාධාරණ අයුරින් වෙළෙඳාමක් කර ගෙන ධනය උපයා ගන්නවා. ඔවුන් කිසිදු විටෙක තැරැව් ගාස්තු අය නොකර කූට උපක්‍රම අනුගමනය නො කර දැහැමින් ජීවත් වීමට වෙර දරනවා. ඒ අතර විවිධ දේ නිෂ්පාදනය කරමින් විවිධ ජීවන වෘත්තීන් අනුගමනය කරන බව ද අපට දක්නට ලැබෙනවා.

**උදාර** : සමාවන්න ගුරුතුමනි, විවිධ ජීවන වෘත්තීන් කියන්නේ මොනව ද කියලා පැහැදිලි කළොත් හොඳ යි කියා හිතනවා.

**ගුණවර්ධන ගුරුතුමා**: ඒ කියන්නේ පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය, හස්ත කර්මාන්තය, කරණවෑම් වෘත්තිය, කුඹල් කර්මාන්තය, කම්කරු වෘත්තිය, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය හා, විසිතුරු පැළ වර්ග මල් වර්ග වගා කිරීම ආදි දේවල් විවිධ ජීවන වෘත්තීන් ලෙස හඳුන්වන්න පුළුවන්.

උදුර: හොඳයි එවැනි කර්මාන්ත ඔබතුමා සාධාරණ ධනෝපායන මාර්ග වශයෙන් හඳුන්වනවා. ඔය කර්මාන්ත ම අසාධාරණ පැත්තට යොමු කර ගන්නට කෙනකුට බැරිකමක් නැහැ නේ ද?

**විදුහල්පතිතුමා**: ඔව්, උදුරගේ ප්‍රකාශය නිවැරැදි යි. ඕන නම් කෙනකුට මෙම නිෂ්පාදනවල ගුණාත්මක බව අඩු කර, ව්‍යාජ ලෙස මවා පාමින් ධනය උපයන්න පුළුවන්. අද සමාජයේ එ වැනි දේ කොතෙකුත් සිදු වෙනවා.

උදුර: මේ වන විට අප දැන ගත්තා වර්තමානයේ මිනිසා ධනය උපයා ගැනීමට අනුගමනය කරන ක්‍රියා මාර්ග මොනවා ද කියලා. ඒවා තුළ ධාර්මික බවක් මෙන් ම අධාර්මික බවක් ද අප දකිනවා. අපේ ලොකු හාමුදුරුවන් වහන්සේ මෙතෙක් වේලා නිහඬ ව වැඩ සිටියා. මා දැන් අවධානය යොමු කරන්නේ ඔබවහන්සේ දෙසට, ගෞරවයෙන් ආරාධනා කරනවා මෙතෙක් වෙලා සාකච්ඡා කළ කරුණු අපේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් පැහැදිලි කර දෙන ලෙස.

**ලොකු හාමුදුරුවන් වහන්සේ**: පින්වත් ඔබ හැමදෙනාට ම තුනුරුවන් සරණ ලැබේ වා. ධනය පුද්ගල ජීවිතයකට අතිශයින් ම අවශ්‍ය බව මෙතෙක් වේලා සාකච්ඡා වුණු කරුණුවලින් අපට පසක් වුණා. බුද්ධ දේශනාව අනුව මිනිසාට ධනය අවශ්‍ය බව පැහැදිලි යි. නමුත් එම ධනය උපයන්නට අනුගමනය කළයුතු මාර්ග, නැතහොත් ක්‍රමවේද මොනව ද කියලා බුදුහාමුදුරුවෝ ඉතාමත් හොඳට පැහැදිලි කරනවා.

එහි දී පළමුවැන්න වශයෙන් පෙන්වා දෙන්නේ තමා ධාර්මික ප්‍රතිපත්තියක පිහිටා ධනය රැස්කළ යුතු බව යි. ඒ කියන්නේ පංචසීල ප්‍රතිපදාව මෙහි දී ඉතාමත් වැදගත් වෙනවා. එ සේ ම ධාර්මික වී අනුගමනය කරනු ලබන ඕනෑ ම ක්‍රියාමාර්ගයකින් උපයන ධනය ධාර්මික ධනයක් වශයෙන් හඳුන්වන්න පුළුවන්. ගොවිතැන දැහැමි ධනෝපායන ක්‍රමයක් බව බුදුරදුන් පෙන්වා දෙනවා.

වෙළෙඳාම ද දැහැමි ලෙස ධනය උපයා ගැනීමේ ක්‍රමයක්. එහි දී බුදුරදුන් පෙන්වා දෙන්නේ කූට උපක්‍රම අනුගමනය නො කළ යුතු බවයි. කිසියම් කෙනකු වෙළෙඳාම් කරන විට

හොරට කිරනවා නම්, හොරට මනිනවා නම්, මුදල් වංචා කරනවා නම්, අල්ලස් ගන්නවා නම්, තැරැව් ගාස්තු ගන්නවා නම් රත්‍රං නොවන දේ රත්‍රං වශයෙන් පෙන්වා විකිණීම ආදී වංචා කරනවා නම්

ඒවා වෙළෙඳාමේ අධාර්මික ක්‍රියාවන්. විශේෂයෙන් නො කළ යුතු වෙළෙඳාම් පහක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා.

- අවි ආයුධ වෙළෙඳාම
- සත්ත්ව වෙළෙඳාම
- මස් වෙළෙඳාම
- වස විස වෙළෙඳාම
- මත්ද්‍රව්‍ය වෙළෙඳාම



මෙවැනි වැරැදි ක්‍රියාවන්ගෙන් වෙන් වී කරන වෙළෙඳාම ධාර්මික වන අතර එමගින් උපයන ධනය දැහැමි ධනයක්.

ගවයන් රැකබලා ගැනීම ද ධනය ඉපයීමේ දැහැමි ක්‍රියා මාර්ගයක්. විශේෂයෙන් ගවයා ධනෝපායනය සඳහා මිනිසාට උපකාරි වන සත්ත්වයෙකි. පස්ගෝරස ලබා දෙමින් ගොවිතැන්වලදී සී සෑම, ධාන්‍ය ප්‍රවාහනය, පොහොර ලබා දීම වැනි කටයුතුවලින් ගවයා සහාය වෙනවා. එහෙත් මස් පිණිස සතුන් ඇති කිරීම අධාර්මික ධනෝපායන ක්‍රමයක්.

රාජ්‍ය සේවය ද දැහැමි ව ධනය උපයන මාර්ගයක් ලෙස බුදුරදුන්ගේ ඇගයීමට ලක් වී තිබෙනවා. කාලය අපතේ නො යවා තම රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමත් අවංකව රාජ්‍ය දේපළ ආරක්ෂා කරමින් තමා ලබන වේතනයට ණයකරුවකු නොවී ක්‍රියා කිරීමත් අල්ලස් හෝ දූෂණයන්ගෙන් වැළකීමත් මෙහි දී අවධාරණය කරනවා.

ඒ අතර ගෘහ කර්මාන්ත, හස්ත කර්මාන්ත, ආදි වශයෙන් මීට පෙර දැක්වූ ක්‍රියා මාර්ග ද බුදුදහමෙන් අගය කරනවා. කෙසේ වුවත් දැතේ දෙපයේ වෙර වීරිය යොදවා දහදිය වගුරුවා අධාර්මික පිළිවෙත්වලින් බැහැර වී අනුගමනය කරන ක්‍රියා මාර්ගවලින් උපයන ධනය ධාර්මික ධනයක් වන බව පැහැදිලි ය. එසේ ධනය උපයා යැපීම මිථ්‍යා ආජීවයෙන් ඉවත් වී සම්මා ආජීවයෙන් ජීවත් වීම යි.

**කිසිදු විටෙක තමන් නිසා හෝ අනුන් නිසා හෝ තම අඹුදරුවන් නිසා හෝ රටවැසියන් නිසා හෝ අධාර්මික ව ධනය නො ඉපදවිය යුතු ය.**


න අත්ත හේතු න පරස්ස හේතු - න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං, න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො - ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා.

යන ගාථාව ඉහතින් මා දැක්වූ අදහස් සනාථ කරනවා.

ඒ සමග ම ධනය ඉපයීමේ දී උට්ඨාන වීර්යයෙන් යුක්ත ව, අනලස් ව, කුසීත බවින් තොර ව, දැහැමි පිළිවෙත් සුරකිමින් ධනය ඉපයීම බුදුදහම අගය කරනවා.

**උදුර:** අවසරයි අපේ හාමුදුරුවනේ, ඔබ වහන්සේ ඒ අයුරින් ධාර්මික ධනය උපයා ගන්නා ආකාරය විස්තර කරද්දී මට මතක් වුනා ලෝකෝපකාරයේ දැහැමි ධනය පිළිබඳ ව කියවෙන කවියක්

අදමින් ලත් ඉසුරු  නොපවතී සොරුන් සෙව් දන මෙන්
දහමින් ලත් ඉසුරු  සැපත් එසුරිඳු ලත් ඉසුරු මෙනි
නිදුකින් සව් ඉසුරු  මද ව ලැබෙතත් නුවණ ඇතියෝ
අනුන් නසා ලබන  ඉසුරු සලකත් වසුරු අයුරින්




ඒ අනුව 'අපි ද දැහැමි පිළවෙත්වලට අනුව කටයුතු කරමින් ධාර්මික ධනයක් උපයා ගැනීමට උත්සාහ කරමු' යන ප්‍රාර්ථනාව ඔබ හමුවෙහි තබනවා. අපේ දම්සභා මණ්ඩපය නිමා කිරීමට පෙර මා කැමති යි ශ්‍රාවක ඔබ සැමට අවස්ථාවක් උදාකර දෙන්නට. මෙම  සාකච්ඡාවේ දී ඔබට ඇතිවූ යම් ගැටලුවක් වෙතොත් මේ විද්වත් මණ්ඩලයට ඉදිරිපත් කරන්න.

**දෙමාපියන් අතරින්:** අවසර අපේ හාමුදුරුවනේ, වර්තමානයේ මිනිසා ජීවත් වීම  සඳහා කුකුළන් ඇති කරනවා, බිත්තර විකුණනවා, සුරතල් මාළුවන් විකුණනවා, සුරතල් කුරුල්ලන් විකුණනවා. මෙ වැනි දේවල් කිරීමෙන් ලබන ධනය ධාර්මික ද අධාර්මික ද කියලා දැනගන්න කැමති යි.

**ලොකු හාමුදුරුවන් වහන්සේ:** කෙටියෙන් කියනවා නම් ඒ සියල්ල අධාර්මික දේවල්. අපේ බුදු හාමුදුරුවෝ පෙන්වා දීලා තියනවා නේ  මස් පිණිස සතුන් ඇති කිරීම නො කළයුතු දෙයක් කියල. එ සේම  බිත්තරවලට ප්‍රාණයක් තියෙනවා. ඒවා විකිණීමත්. කෙනකුගේ නිදහස නැති කොට හිර කර තබා ගැනීමත් අකුසල කර්ම. මස් පිණිස සතුන් ඇති කිරීම විකිණීම සුරතල් කුරුල්ලන් කූඩු කර විකිණීම වැනි රැකියා අධාර්මික ජීවන වෘත්තීන්.

උදර :  හොඳයි එහෙම නම් දූන් අපේ දම් සභාව නිමාවට පත් කිරීමට කාලය එළඹ තිබෙනවා. අද දින අප සියලු දෙනාට ධාර්මික ව ධනය උපයා ගෙන දැහැමි ජීවිතයකට අවතීර්ණ වන්නේ කෙසේ දැයි අපේ විද්වත් මණ්ඩලය මැනවින් විස්තර කර දුන්නා. අද අපි මේ සාකච්ඡා කළ සියල්ල සාරාංශ වශයෙන් මෙසේ දක්වන්න පුළුවන්.

## සාරාංශය

මානව ජීවිතය හා බැඳුණු ප්‍රබල සාධකයකි ධනය. ධනය උත්පාදනයේ දී විවිධ ක්‍රම අනුගමනය කරන බව වර්තමාන මිනිස් චර්යාවන් තුළින් පැහැදිලි වෙනවා. එහි ධාර්මික හා අධාර්මික වශයෙන් පැති දෙකක් තිබෙනවා. බුදුදහමට අනුව පංචසීල ප්‍රතිපදාවෙහි පිහිටා තිදොර සංවර කර ගෙන දෑතේ දෙපයේ වෙර වීරිය යොදවා දහඩිය වගුරවා උට්ඨාන වීර්යයෙන් ධනය ඉපයිය යුතු වේ. කෘෂි කර්මාන්තය, වෙළෙඳාම, ගව පාලනය, රාජ්‍ය සේවය, විවිධ කර්මාන්තයන්හි යෙදීම දැහැමි ධනෝපායන ක්‍රම ලෙස හැඳින්වෙනවා. වැරදි වෙළෙඳාම්, හොර කිරුම් මිනුම්, අල්ලස් ගැනීම් වැනි දේවල් අධාර්මික ධනෝපායන ක්‍රම වශයෙන් පෙන්වා දී තිබෙනවා.

මෙ වැනි දහම් අවබෝධයක් ලබා දෙමින්, ධර්ම දානමය පිංකමක් සිද්ධ කළ අපේ ලොකු හාමුදුරුවන්ට සහ විදුහල්පතිතුමා ප්‍රධාන සැමට ම තෙරුවන් සරණින් දීර්ඝායුෂ ලැබේවා යි ප්‍රාර්ථනා කරනවා. එසේ ම මෙයට සහභාගී වූ දෙමාපියන් ඇතුළු ඔබ සියලු දෙනාටත් තෙරුවන් බෙලෙන් සුභ අනාගතයක් උදා වේවා යි ප්‍රාර්ථනා කරනවා.

## ක්‍රියාකාරකම්

01. වර්තමානයෙහි දක්නට ලැබෙන අධාර්මික ධනෝපායන ක්‍රම පහක් නම් කරන්න.

02. ඔබ හඳුනා ගත් ධාර්මික ධනෝපායන ක්‍රම මොනවාදැයි පෙන්වා දෙන්න.

03. සතුන් වෙළෙඳාම ආදි පස් වැදෑරුම් වෙළෙඳාම් අධාර්මික ධනෝපායන ක්‍රම ලෙස ඔබ පිළිගන්නේ ඇයි ද යි පැහැදිලි කරන්න.

## පැවරුම

''දැහැමි ධනය සතුට සදයි'' යන තේමාව යටතේ රචනාවක් ලියන්න.

සෙල්ලම් සිතින් වත්
යම්කිසි තරහකින් වත්
මරණ සිතකින් වත්
සතුන් හට වද දීම නොහොබිත්

සිරිත් මල්දම